# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. :
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2016-08-16

පැමිණිලිකරු : කේ.එස්.ඩබ්. ජයරත්න මයා,
251/31 එස්, කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

වගඋත්තරකරු : විදුහල්පති,
විශාඛා විද්‍යාලය,
වජිර පාර,
කොළඹ 05.

පැමිණිලි අංකය : **HRC/578/16/L - 13**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් දන්වා ඇත්තේ 2016 වසරේදී තම දරුවා කොළඹ විශාඛා විද්‍යාලයේ 1 වන ශ්‍රේණියට ඇතුළත් කොට ගැනීමේ අරමුණින් "ආසන්නතාවය" යටතේ අයදුම්පත් යොමු කර සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී ලකුණු 63ක් හිමිකර ගත් බවයි. තමා ඉදිරිපත් කළ හිමිකම් ඔප්පුව තෑගි ඔප්පුවක් වන බවත් එය 2001 වසරේදී තමාට හිමිකම පවරා දීම සම්බන්ධයෙන් සකසා ඇති ඔප්පුවක් වන බවත් ඒ සඳහා තමන්ට ලකුණු 2ක් පමණක් ලබාදී ඇති බවත් නමුත් එයට සම්පූර්ණ ලකුණු ලබා ගැනීමේ හිමිකම තමා වෙත පවතින බවත් වැඩිදුරටත් දන්වා ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් තම ලිඛිත හා වාචික කරුණු කොමිෂන් සභාව හමුවේ ගොනු කරමින් වගඋත්තරකාර පාර්ශවය දන්වා ඇත්තේ පැමිණිලිකාරිය විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කොට ඇති තෑගි ඔප්පුව 1987 වසරේදී කුටුම්භ ලේඛනයක් මත

සකසා ඇති ප්‍රකාශන ඔප්පුවක් මත 2001 වසරේදී සකසන ලද තෑගි ඔප්පුවක් වන බවත් ඒ අනුව එම තෑගි ඔප්පුව සඳහා සම්පූර්ණ ලකුණු ලබානොදීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය තීරණය කළ බවත් එය ලියාපදිංචි නොකළ බද්දු ඔප්පු ගණය යටතේ සලකා ලකුණු 2ක් පමණක් ලබාදීමට තීරණය කර ඇති බවත්ය.

එසේම පදිංචිය තහවුරු කිරීමේ වෙනත් ලේඛන 5 අතුරින් දරුවාගේ උප්පැන්න සහතිකයේ පමණක් නිවැරදිව ලිපිනය සටහන් වී තිබීම හේතුවෙන් ඒ සඳහා එක් ලකුණක් ද ආසන්න පාසල් 5ක් සඳහා ලකුණු අඩු කිරීමට සිදුවූ බැවින් ඒ සඳහා ලකුණු 25ක් පමණක්ද ලබාදීමට සිදුවීම මත මුළු ලකුණු 63ක් පමණක් පැමිණිලිකාරිය උපයාගෙන ඇති බවත් ආසන්නතාවය යටතේ පාසලට ඇතුලත් කොට ගත් අවම ලකුණු සීමාව ලකුණු 65.5ක් බවත් ඒ අනුව පැමිණිලිකාරිය අවම ලකුණු සීමාවට ලගා නොවීම හේතුවෙන් ඇයගේ දරුවා පාසලට ඇතුලත් කර නොගැනීමට තීරණය කළ බවත් වැඩිදුරටත් දන්වා ඇත.

තවද පදිංචි ස්ථානයට අදාළව ව්‍යාපාරික ස්ථානයක් පවත්වා ගෙන යන බවත් ඒ මත තවදුරටත් පදිංචිය සැකසහිත බවත් කෙසේ නමුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හෝ අභියාචනා පරීක්ෂණ මණ්ඩලය පැමිණිලිකාරියගේ පදිංචි ස්ථානය සම්බන්ධයෙන් කිසිදු අවස්ථාවක ස්ථානීය පරීක්ෂණයක් සිදු නොකළ බවත් දන්වා ඇත. එසේම මේ වනවිට පැමිණිලිකාරියගේ දරුවා පොරොත්තු ලේඛනයේ 8 වන ස්ථානයේ ස්ථානගතව ඇති බවද දක්වා ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලිකාරිය "ආසන්නතාවය" යටතේ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අතර සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී ලකුණු 63ක් උපයා ඇති බවත් ආසන්නතාවය යටතේ පාසලට ඇතුලත් කොට ගෙන ඇති අවම ලකුණු සීමාව ලකුණු 65.5ක් වන බවත් අනාවරණය වේ.

සුදුසුකම් ලද දරුවෙකු ලෙස පාසලට ඇතුලත් කොට නොගැනීමට බලපා ඇති ප්‍රධාන හේතු ලෙස සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කොට ඇති හිමිකම් ඔප්පුව අදාළ වී ඇති බවද නිරීක්ෂණය වී ඇත.

හිමිකම් ඔප්පුව තෑගි ඔප්පුවක් වන අතර එය 2001 වසරේදී සකසා ඇත. වගඋත්තරකාර පාර්ශවය ඉදිරිපත් කොට ඇති කරුණුවලට අනුව එකී ඔප්පුව පිළිගත හැකි ලේඛනයක් නොවන බවට දක්වා ඇත්තේ එකී තෑගි ඔප්පුව 1987 වසරේදී කුටුම්භ ලේඛනයක් මත සකසා ඇති ප්‍රකාශන ඔප්පුවක් මත සකසන ලද්දක් වීම වන බව දක්වා ඇත. ඒ අනුව එයට ලකුණු ලබාදී ඇත්තේ ලකුණු 2ක් පමණක් වන අතර. චක්‍රලේඛය ප්‍රකාරව පවතින නිශ්චිත හිමිකම්

ඔප්පුවක් සඳහා උපරිම ලකුණු 10 ක් උපයා ගැනීමේ නෛතික හැකියාව පවතින බව තවදුරටත් නිරීක්ෂණය වේ. මෙම කරුණ කොමිෂන් සභාව ගැඹුරින් සලකා බලන ලද අතර හිමිකම් ඔප්පුව යන සාධකය චක්‍රලේඛය මගින් සලකා බලනු ලබන්නේ කුමන මූලික අරමුණක් සඳහාද යන්න කෙරෙහි අවධානය යොමු කර ඇත. එනම්, සැබවින්ම හිමිකම් ඔප්පුව යන සාධකය මගින් චක්‍රලේඛය ප්‍රකාරව අපේක්ෂා කරනු ලබන්නේ සත්‍ය ලෙසම කිසියම් පදිංචි ස්ථානයක හිමිකම පරීක්ෂා කිරීම නොවන අතර එමගින් පදිංචිය තහවුරු කර ගැනීමට කිසියම් උපකාරයක් වේද යන කාරණය සඳහා පමණි. ඒ අනුව සලකා බැලීමේදී පදිංචිය පිළිබඳ කිසිදු සැකසහිත භාවයක් පැනනැගී නොමැති අවස්ථාවක සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හිමිකම් ඔප්පුවෙහි පවතින නීත්‍යානුකූල භාවය ගැඹුරින් විශ්ලේෂණය කරමින් 1987 වැනි දීර්ඝ අතීතයකට අයිතිවාසිකම් පරීක්ෂා කිරීමට අදහස් කළේ කුමන මූලික අරමුණක් සඳහා ද යන්න කොමිෂන් සභාව හමුවේ ගැටළුවක් ලෙස මතුව ඇත.

පදිංචිය සම්බන්ධයෙන් කිසියම් සැකසහිතභාවයක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා පරීක්ෂණ මණ්ඩලය හමුවේ පැවතියේ නම් චක්‍රලේඛය ප්‍රකාරව සිදු කරනු ලැබිය යුත්තේ ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමයි. නමුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හෝ අභියාචනා පරීක්ෂණ මණ්ඩලය පැමිණිලිකාරියගේ පදිංචිය සම්බන්ධයෙන් කිසිදු අවස්ථාවකදී ස්ථානීය පරීක්ෂණයක් සිදු කොට නොමැති බව නිරීක්ෂණය වේ. එසේනම් ව්‍යාංගාර්ථයෙන් අනාවරණය වනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී පදිංචිය සම්බන්ධයෙන් කිසිදු සැකසහිත භාවයක් පැනනැගී නොමැති බවයි. අවම වශයෙන් පැමිණිලිකාරිය ඉදිරිපත් කොට ඇති හිමිකම් ඔප්පුව සම්බන්ධයෙන් වෙනත් අයදුම්කරුවෙකු විසින් විරෝධතාවයක් හෝ යොමු කොට නොමැති අවස්ථාවක හා එකී නැගී ඔප්පුවේ පවතින වෙනත් ගැටලුවක් පැනනැගී නොමැති අවස්ථාවක වසර 30 ක් පමණ ඉතා දීර්ඝ අතීතයක් දක්වා කරුණු සොයා බලමින් සිදු කිරීමට අපේක්ෂා කර ඇත්තේ කුමන සාධාරණ තේරීමක්ද යන්න ප්‍රශ්න ගතවී ඇත.

කෙසේ වෙතත් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ල විභාග වන අවස්ථාව වනවිට වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකාරිය පදිංචි ස්ථානය තුළ ව්‍යාපාරික ස්ථානයක් පවත්වා ගෙන යන බවට කරුණු ගොනු කිරීමට උත්සහ දරා ඇති බව නිරීක්ෂණය වේ. නමුත් පදිංචි ස්ථානයක් තුළ ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම පදිංචිය අභියෝගයට ලක් කිරීමේ නීත්‍යානුකූල කාරණයක් ද යන්න තහවුරු කිරීමට වගඋත්තරකාර පාර්ශවය අපොහොසත්වී ඇත.

එසේම තවදුරටත් වගඋත්තරකාර පාර්ශවය ඉදිරිපත් කොට ඇති ප්‍රධාන කාරණයක් වන්නේ පැමිණිලිකාරිය අයදුම්පත් යොමු කොට ඇති ලිපිනයට ඉදිරිපත් කොට ඇති හිමිකම් ඔප්පුව අදාළ නොවන බවයි. එනම් ඉදිරිපත් කොට ඇති හිමිකම් ඔප්පුවේ ලිපිනය අංක 251/31/වී, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05 යන ලිපිනය පවතින බවත් පැමිණිලිකාරිය පාසලට

ඉදිරිපත් කොට ඇති අයදුම්පත්‍රයේ 251/31/එස් යන ලිපිනයෙන් ඉදිරිපත් කොට ඇති බවත් ඒ අනුව ඉහත හිමිකම් ඔප්පුව සඳහා තවදුරටත් ලකුණු ලබාදීමේ හැකියාවක් නොමැති බවත්ය. මෙම කාරණය සම්බන්ධයෙන් කොමිෂන් සභාව කරුණු සලකා බැලීමේදී හිමිකම් ඔප්පුවෙහි පවතින නිත්‍යානුකූල භාවය පරීක්ෂා කිරීම සඳහා වසර 30ක් වැනි අතීතයක් දක්වා ගමන් කොට ඇති වගඋත්තරකරුවන් ඔප්පුවේ පවතින කරුණු කෙරෙහි කිසිදු අවධානයක් යොමු වී නොමැති බව අනාවරණය වී ඇත. එනම්. ප්‍රශ්න ගත හිමිකම් ඔප්පුව මගින් පැමිණිලිකාරියට ඇයගේ පියා විසින් 251/31/එස්, 251/31/වී, 251/31/යූ යන පරිශ්‍රයන් තුන සඳහාම හිමිකම පවරා දීමක් සිදුකොට ඇත. ඒ අනුව එකම පර්චස් 7ක් තුළ පවතින පරිශ්‍රයන් තුනක හිමිකම පැමිණිලිකාරිය සතු වන බවත් ඇය එම ස්ථානයේ ස්ථිරව පදිංචිව සිටින බවත් එසේම එම ස්ථානයේ තනිපුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන බවත් පැහැදිලිවම නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර පාර්ශවය මෙම කාරණය සම්බන්ධයෙන් සාධාරණ ලෙස කරුණු සලකා බැලුවේ නම් වසර 30ක වැනි අතීතයක් කරා දුෂ්කර පරීක්ෂාවක් සිදු කරමින් කටයුතු කිරීමේ අවශ්‍යතාවයක් ඇති වන්නේ නැති බැව් නිරීක්ෂණය වේ. පැහැදිලිවම චක්‍රලේඛයේ පවතින නෛතික ප්‍රතිපාදනයන් අනිසි ආකාරයෙන් යොදා ගැනීමට උත්සහ දරා ඇති බවත් එමගින් චක්‍රලේඛය මගින් අපේක්ෂා කොට ඇති පදිංචිය තහවුරු කර ගැනීම යන මූලික අරමුණින් පරිබාහිරව කිසිදු ආකාරයෙන් චක්‍රලේඛයෙන් අපේක්ෂා කොට නොමැති වෙනමම පරස්පර ක්‍රියාවකට චක්‍රලේඛයේ ප්‍රතිපාදන මෙවලමක් ලෙස භාවිතා කොට ඇති බවත් එකී ක්‍රියාව මගින් වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට ක්‍රියා කර ඇති බවත් අනාවරණය වී ඇත.

ඒ අනුව චක්‍රලේඛය ප්‍රකාරව පැමිණිලිකාරියගේ හිමිකම් ඔප්පුව සඳහා උපයා ගත හැකි උපරිම ලකුණු සීමාව වන ලකුණු 10 උපයා ගැනීමේ නෛතික හිමිකම පැමිණිලිකාරිය වෙත පවතින බව නිරීක්ෂණය වී ඇත. ඒ අනුව පැමිණිලිකාරියගේ දියණියට හිමිවන ලකුණු සංඛ්‍යාව 08 කින් වැඩිවිය යුතු අතර මුළු ලකුණු සංඛ්‍යාව 71 ක් විය යුතු බවද නිරීක්ෂණය වේ.

නිගමනය :-

ඉහත සියලු කරුණු සලකා බැලීමේදී වගඋත්තරකාර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ක්‍රියාවන් හේතුවෙන් පැමිණිලිකාරියගේ දරුවා විශාඛා විද්‍යාලයේ 1 ශ්‍රේණියට ඇතුළත් කොට ගැනීමට ඇති හිමිකම අහිමි කර ඇති බවටත් එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් ආරක්ෂා කොට ඇති සර්ව සාධාරණත්වයේ මූලික අයිතිය උල්ලංඝනය වී ඇති බවටත් මෙම පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව පැමිණිලිකාරියගේ දරුවා වගඋත්තරකාර කොළඹ විශාඛා විද්‍යාලයේ 2016 වර්ෂයේ 1 වන ශ්‍රේණියට ඇතුලත් කිරීමට වහාම කටයුතු කළයුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2016.09 .01 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. N. D. Udagama
Chai
Human Rights Commiss Lanka

පිටපත :- ලේකම්, - අවශ්‍ය පියවර ගැනීම සඳහා
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.